““ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2294/55 - 2022 අගෝස්තු මස 26 වැනි සිකුරාදා - 2022.08.26

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.-බී 12/2017.

### 2016 අංක 10 දරන හෝමියෝපති පනත

2016 අංක 10 දරන හෝමියෝපති පනතේ 30 වන වගන්තිය සහ 16 වගන්තිය සමග කියවිය යුතු, එකී පනතේ 47 වන වගන්තිය යටතේ සෞඛ්‍ය අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

කෙහෙලිය රඹුක්වැල්ල,
සෞඛ්‍ය අමාත්‍ය.

2022 ජුනි මස 10 වැනි දින,
කොළඹ දී ය.

### නියෝග

1. මේ නියෝග 2022 හෝමියෝපති (හෝමියෝපති වෛද්‍ය වෘත්තිකයන් ලියාපදිංචි කිරීමේ) නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. 2016 අංක 10 දරන හෝමියෝපති පනතේ 30(1) වගන්තිය යටතේ හෝමියෝපති වෛද්‍ය වෘත්තිකයෙකු වශයෙන් ලියාපදිංචි වීම සඳහා හිමිකම් ඇත්තා වූ සෑම තැනැත්තෙකු විසින් ම පහත දැක්වෙන ලේඛන සමගින්, පිළිවෙළින් මෙහි පළමු උපලේඛනයේ සහ දෙවන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ආකෘතියට අනුව සහ අදාල සැකසුම් ගාස්තු සමග (මෙහි මින්මතු ''සභාව'' යනුවෙන් හඳුන්වනු ලබන) හෝමියෝපති වෛද්‍ය සභාව වෙත අයදුම්පත්‍රයක් ඉදිරිපත් කරනු ලැබිය යුතුය :-

(අ) ග්‍රාම නිලධාරි විසින් නිකුත් කරනු ලබන සහතිකයක් ;

(ආ) හෝමියෝපති ඖෂධ මිළදී ගැනීමේ බිල්පත් සහ රිසිට්පත් ;

(ඇ) හෝමියෝපති ලිපිගොනු වාර්තා ;

(ඈ) අදාළ පළාත් පාලන ආයතනය විසින් නිකුත් කරනු ලබන සහතිකය ;

(ඉ) ස්වකීය සායන පරිශ්‍ර සඳහා අදාල පළාත් පාලන ආයතනය විසින් නිකුත් කරනු ලබන ගෙවීම් රිසිට්පත්.

1A - G 36992 — 166 (2022/08)

මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

3. (1) එවැනි ඉල්ලීමක් ලැබීමේ දී සභාව විසින්, අයදුම්පතෙහි වූ තොරතුරු සත්‍යායනය කර ගැනීම සඳහා අයදුම්පත් මණ්ඩලයක් පත් කරනු ලැබිය යුතු ය.

(2) අයදුම්පත් මණ්ඩලය -

(අ) දේශීය වෛද්‍ය විෂයය පවරා ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් නම් කරනු ලබන නියෝජිතයෙකුගෙන් ;

(ආ) වසර හතරකට නොඅඩු සේවා පළපුරුද්දක් සහිත සභාවේ සාමාජිකයෙකු ලෙස ලියාපදිංචි හෝමියෝපති වෛද්‍ය වෘත්තිකයෙකුගෙන් ; සහ

(ඇ) සභාවේ රෙජිස්ට්‍රාර්වරයාගෙන්,

සමන්විත විය යුතු ය.

4. (1) විභාග දිනයට යටත් පිරිසෙයින් මාස තුනකට පෙරාතුව පත් කරනු ලබන (මෙහි මින්මතු ''එකී පනත'' යනුවෙන් සඳහන් කරනු ලබන) 2016 අංක 10 දරන හෝමියෝපති පනත යටතේ හෝමියෝපති වෛද්‍ය වෘත්තිකයන් ලියාපදිංචි කිරීම සඳහා වූ පහත දැක්වෙන සුදුසුකම් සහිත සාමාජිකයන් හත්දෙනෙකුගෙන් සමන්විත වන (මෙහි මින්මතු ''මණ්ඩලය'' යනුවෙන් සඳහන් කරනු ලබන) විභාග පරීක්ෂක මණ්ඩලයක් තිබිය යුතුය :-

(අ) පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝමියෝපති වෛද්‍ය විද්‍යාව පිළිබඳ උපාධියක් සමග වසර පහකට නොඅඩු සේවා පළපුරුද්දක් සහිත ලියාපදිංචි හෝමියෝපති වෛද්‍ය වෘත්තිකයෙකු වීම ;

(ආ) බටහිර හෝ ආයුර්වේද වෛද්‍ය ක්‍රමවේදය පිළිබඳ ලියාපදිංචි වෛද්‍ය වෘත්තිකයෙකු වීම ;

(ඇ) වෛද්‍ය විද්‍යාවට අදාල ඕනෑම විෂයයක් පිළිබඳ පශ්චාත් උපාධියක් දරන්නෙකු වීම ; සහ

(ඈ) පිළිගත් විශ්වවිද්‍යාලයකින් වෛද්‍ය විද්‍යාව පිළිබඳ ලබාගත් උපාධියක් සමග මහජන හෝ සෞඛ්‍ය සේවයේ වසර පහකට නොඅඩු සේවා පළපුරුද්දක් සහිත තැනැත්තෙකු වීම.

(2) සභාව විසින්, සාමාජිකයන් හතර දෙනෙකු පත් කරනු ලැබිය යුතු අතර, දේශීය වෛද්‍ය විෂයය පවරා ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් සෙසු සාමාජිකයන් තිදෙනා පත් කරනු ලැබි යුතු ය.

(3) මණ්ඩලයේ සාමාජිකයන් විසින් එහි එක් සාමාජිකයෙකු එහි සභාපතිවරයා ලෙස පත් කරගනු ලැබිය යුතුය.

5. දේශීය වෛද්‍ය විෂයය පවරා ඇති අමාත්‍යවරයා විමසා, සභාව විසින් තීරණය කරනු ලබන අනුප්‍රමාණ අනුව මණ්ඩලයේ හා අයදුම්පත් මණ්ඩලයේ සාමාජිකයන් වෙත පාරිශ්‍රමික ගෙවනු ලැබිය යුතු ය.

6. මණ්ඩලයේ සාමාජිකයන් විසින් පරීක්ෂා කිරීමට නියමිත විෂයයන්, සභාව විසින් එකී සාමාජිකයන් වෙත පැවරිය යුතු අතර, එකී විෂයයන් පිළිබඳව සාමාජිකයන් විසින් ප්‍රශ්න සකස් කළ යුතු ය.

7. මේ නියෝගවල කාර්යය සඳහා, විභාග පරීක්ෂක මණ්ඩලයේ බලතල සහ කර්තව්‍යය පහත සඳහන් පරිදි විය යුතු ය :-

(අ) සභාව විසින් නිශ්චය කරනු ලැබිය හැකි ආකාරයට පිළිතුරු ද සමග අදාල විෂයයට අදාළ ප්‍රශ්න සැකසීම,

(ආ) ප්‍රශ්නපත්‍ර මුද්‍රණය කිරීමට කටයුතු සැලැස්වීම සහ එම ප්‍රශ්නපත්‍ර, මුද්‍රා තබන ලද කවරයක, දේශීය වෛද්‍ය විෂයය පවරා ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත රහසිගත ලෙස භාරදීම,

(ඇ) පිළිතුරුපත්‍ර පරීක්ෂා කරනු ලබන අතරතුර දී, විභාග පරීක්ෂක මණ්ඩලයේ අදහස් අනුව අවධානය යොමු කිරීම වැදගත් බවට සලකන යම් කාරණයක්, රහසිගතව, මුද්‍රා තබන ලද කවරයක, මණ්ඩලයේ සභාපතිවරයා වෙත ඉදිරිපත් කිරීම.

8. දේශීය වෛද්‍ය විෂයය පවරා ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් මේ නියෝග යටතේ පවත්වනු ලබන යම් විභාගයක මුද්‍රිත ප්‍රශ්නපත්‍ර සහ පිළිතුරුපත්‍ර ස්වකීය භාරයේ ආරක්ෂිතව තබාගත යුතු වේ.

9. සභාව විසින්, දේශීය වෛද්‍ය විෂයය පවරා ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ විභාග ඒකකයේ සහයෝගීතාව ඇතිව, මේ නියෝග යටතේ යම් විභාග පවත්වනු ලැබිය යුතු ය.

10. මේ නියෝග යටතේ පවත්වනු ලබන යම් විභාගයක ප්‍රතිඵල රෙජිස්ට්‍රාර්වරයා විසින් සහාගත කරනු ලැබිය යුතු ය.

11. සභාව විසින්, 10 වන නියෝගය යටතේ රෙජිස්ට්‍රාර්වරයා විසින් සහාගත කරනු ලබන ප්‍රතිඵල පිළිබඳ සෑහීමට පත්වීමෙන් පසුව, එකී විභාග ප්‍රතිඵල එම විභාගයේ විභාග අපේක්ෂකයන් වෙත සන්නිවේදනය කරන ලෙස සභාවේ රෙජිස්ට්‍රාර්වරයා වෙත විධාන කළ යුතු ය.

12. 11 වන නියෝගය යටතේ සභාව විසින් කරන ලද විධානයක් ලැබීමෙන් අනතුරුව, රෙජිස්ට්‍රාර්වරයා විසින්, එවැනි යම් විභාගයක ප්‍රතිඵල අදාල විභාග අපේක්ෂකයන් වෙත ලියාපදිංචි තැපෑලෙන් සන්නිවේදනය කරනු ලැබිය යුතු ය.

13. යම් සාර්ථක විභාග අපේක්ෂකයෙකු විසින්, තුන්වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ලියාපදිංචි සහතිකය සඳහා වූ ගාස්තු ගෙවීමෙන් අනතුරුව, හතරවන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ආකෘතියෙහි සාරානුකූලව වූ ලියාපදිංචි සහතිකයක් ලබාගත හැකි ය.

**පළමු උපලේඛනය**

අයදුම්පත්‍ර ආකෘතිය

Homoeopathic Medical Council
Samuel Hahnemann
Sri Lanka

**හෝමියෝපති වෛද්‍ය සභාව**

2016 අංක 10 දරන හෝමියෝපති පනතේ 30(1) වගන්තිය යටතේ
හෝමියෝපති වෛද්‍ය වෘත්තිකයන් ලියාපදිංචි කිරීමේ විභාගය

***අයදුම්පත්‍රය***

මාධ්‍යය : සිංහල
දෙමළ
ඉංග්‍රීසි

*කාර්යාල ප්‍රයෝජනය සඳහා*
යොමු අංකය: ..............................................
ලැබීමේ දිනය: ..............................................

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන්) :..............................................................................................................................

2. මුලකුරු සමග නම :...............................................................................................................................................

3. තැපැල් ලිපිනය (පැහැදිලි අකුරෙන්) :

අංකය :.......................................................................................

වීදිය/ගම :...................................................................................

නගරය :...................................................................................... තැපැල් අංකය :...................................................................................

4. උපන් දිනය : 5. වයස : 6. ස්ත්‍රී පුරුෂ භාවය : ස්ත්‍රී / පුරුෂ

7. ජාතික හැඳුනුම්පත් අංකය :.......................................................................................

8. දුරකථන අංකය :

නිවස :........................................... සායනය :............................................ ජංගම :.............................................

9. ස්ථිර /පදිංචි ලිපිනය : ......................................................................................................

..........................................................................................................................

10. ග්‍රාම නිලධාරී කොට්ඨාසය :....................................................................................................

11. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :................................................................................................

12. පොලිස් කොට්ඨාසය :...........................................................................................................

13. වෘත්තියේ යෙදෙන ස්ථානය සහ ලිපිනය :.................................................................................

..........................................................................................................................

14. වෘත්තීය කාලසීමාව :...........................................................................................................

15. හෝමියෝපති වෘත්තීය සඳහා වෙන් කළ කාලය :........................................................................

16. (i) ඔබ වෙනත් යම් වෘත්තියක යෙදී සිටී ද ? ඔව්/නැත

(ii) පිළිතුර ඔව් නම්, විස්තර ලබා දෙන්න ..................................................................................

..........................................................................................................................

17. ඔබගේ හෝමියෝපති ඖෂධ සහ උපයෝගීතා ලබාගන්නේ කෙසේද ? ..............................................

18. අධ්‍යාපන සුදුසුකම් :

අ. පො. ස. (සා.පෙළ) වර්ෂය :............................

| විෂයයන් | ශ්‍රේණිය |
|---|---|
| 1 | |
| 2 | |
| 3 | |
| 4 | |
| 5 | |
| 6 | |
| 7 | |
| 8 | |

අ. පො. ස. (උපෙළ) වර්ෂය :............................

| විෂයයන් | ශ්‍රේණිය |
|---|---|
| 1 | |
| 2 | |
| 3 | |
| 4 | |

19. වෛද්‍ය හෝ වෙනත් වෘත්තීය සුදුසුකම් (ඇත්නම්) :-

20. ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාවය :-

ලිඛිත :- සන්නිවේදන :-

21. (i) ඔබ යම් දිනයක දී 1970 අංක 7 දරන හෝමියෝපති පනතේ 27 වන වගන්තිය යටතේ හෝමියෝපති වෛද්‍ය වෘත්තීය සඳහා ලියාපදිංචිවීම සඳහා ඉල්ලුම්කර තිබේද ? ඔව් / නැත

(ii) පිළිතුර ඔව් නම්, විස්තර ලබා දෙන්න : ..........................................................................................................................

..........................................................................................................................................................

22. ප්‍රකාශනය :

............................... පදිංචි පහත අත්සන් කරනු ලබන .................................... වන මා විසින් මෙම අයදුම්පත්‍රයේ සපයා ඇති සියලු විස්තර මාගේ දැනුමේ ආකාරයට සත්‍ය සහ නිවැරදි බවට මෙයින් ප්‍රකාශ කර සිටිමි. මෙම අයදුම්පත්‍රයේ මා විසින් සපයා ඇති යම් තොරතුරක් සාවද්‍ය හෝ වැරදි සහගත වේ නම් මාගේ ඉල්ලීම නිශ්ප්‍රභා වන බව මා විසින් පිළිගනිමි. සාවද්‍ය තොරතුරු සැපයීම හෝමියෝපති පනත උල්ලංඝනය කිරීමක් බව ද මම දැනුවත්ව සිටිමි. එම කරුණු පිළිබඳ අවබෝධ කරගෙන වර්ෂ 20..... වූ ................... මස ..................... දින මා විසින් මෙම ලේඛනයට අත්සන් තබමි.

දිනය :................................ අත්සන :......................................,

23. සහතික කිරීම

.................................... ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ ග්‍රාම නිලධාරී වන මා විසින් ........................................ යන අයදුම්කරු ඉහත කී කොට්ඨාසයේ පදිංචිකරුවකු බවත් ඔහු ................................ සිට හෝමියෝපති වෘත්තියේ යෙදෙන බවත් මෙයින් සහතික කරමි.

නම :...................................................

ග්‍රාම නිලධාරී කොට්ඨාසය :...................................................

දිනය :................................................... අත්සන :...............................................,

24. ප්‍රාදේශීය ලේකම්වරයාගේ සහතික කිරීම

ඉහත සඳහන් ප්‍රකාශය සත්‍ය සහ නිවැරදි බව මෙයින් සහතික කරමි.

දිනය :................................................... අත්සන :...............................................,

*කාර්යාලීය ප්‍රයෝජනය සඳහාः*

| | | | | |
|---|---|---|---|---|
| ලැබීමේ දිනය | | සම්මුඛ පරීක්ෂණය පැවැත් වූ දිනය | | |

(අ) අපේක්ෂකයාගේ නම :..........................................................................................................................

(ආ) ජාතික හැඳුනුම්පත් අංකය :.....................................................................................................

(ඇ) යොමු අංකය :...................................................................................................................

(ඈ) ප්‍රතිඵලය : තෝරාගන්නා ලදී ☐ ප්‍රතික්ෂේප කරන ලදී ☐

(ඉ) සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ සාමාජිකයන්ගේ අත්සන්

1. ........................................................ ..................................................................
2. ........................................................ ..................................................................
3. ........................................................ ..................................................................
4. ........................................................ ..................................................................
5. ........................................................ ..................................................................

(ඊ) අදහස් ඇත්නම් ඃ

(උ) රෙජිස්ට්‍රාර් විසින් තහවුරු කරන ලදී. ඔව් / නැත

(ඌ) රෙජිස්ට්‍රාර්ගේ අත්සන ඃ

**දෙවන උපලේඛනය**

අයදුම්පත්‍ර සැකසුම් ගාස්තුව

| ගාස්තුවේ ස්වභාවය | ගාස්තු ප්‍රමාණය (රු.) |
|---|---|
| අයදුම්පත්‍ර පරීක්ෂා කිරීමේ ගාස්තුව | 3,000 |
| විභාග සහ මාර්ගෝපදේශ ගාස්තුව | 8,000 |
| විභාග (නැවත පෙනී සිටීම) ගාස්තුව | 7,000 |

**තුන්වන උපලේඛනය**

ලියාපදිංචි සහතිකය සඳහා වූ ගාස්තුව

| ගාස්තුවේ ස්වභාවය | ගාස්තු ප්‍රමාණය (රු.) |
|---|---|
| ලියාපදිංචි ගාස්තුව | 5,000 |
| ලියාපදිංචිය අළුත් කිරීමේ ගාස්තුව | 3,000 |

**හතරවන උපලේඛනය**

ලියාපදිංචි කිරීමේ සහතිකපත්‍ර ආකෘතිය

Homoeopathic Medical Council
Samuel Hahnemann
Sri Lanka

**හෝමියෝපති වෛද්‍ය සභාව**

(2016 අංක 10 දරන හෝමියෝපති පනතේ 30(1) වගන්තිය යටතේ පිහිටුවන ලදී)

**ලියාපදිංචි කිරීමේ සහතිකය**

ලියාපදිංචි කිරීමේ අංකය : ..........................................

.............................................. පදිංචි ....................................................................... යන අය

වර්ෂ 20 ......... වූ ........................ මස ........... දින

2016 අංක 10 දරන හෝමියෝපති පනතේ ............................................................... වගන්තිය යටතේ

හෝමියෝපති වෛද්‍ය වෘත්තිකයෙකු වශයෙන්

ලියාපදිංචි වී ඇති බව මෙයින් සහතික කර සිටිනු ලැබේ.

2016 අංක 10 දරන හෝමියෝපති පනතේ සහ ඒ යටතේ සාදනු ලබන නියෝගවල සඳහන් සියලු අයිතිවාසිකම් සහ වරප්‍රසාද සඳහා ඉහත කී තැනැත්තා නීත්‍යානුකූලව හිමිකම් ලබන්නේය.

**සභාවේ නියමය පරිදි**

දිනය : රෙජිස්ට්‍රාර්.

06-0183

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.